# සුරංගනා ලොවෙන් ආ සුරංගනාවිය

කෞමිණී උපේක්ෂා කුමාරිහාමි

# සුරංගනා ලොවෙන් ආ සුරංගනාවි

කතෘ

කෞමණී උපේක්ෂා කුමාරිහාමි

මහ/මහමායා බාලිකා විදුහල

5 ශ්‍රේණිය

කතෘගේ වෙනත් කෘති

අම්මම්මා

කෘතිය පළ කල දිනය

2025 -02-08

**ISBN No – 978-624-208-497-8**

# පිදුම

**මේ ලියන අකුරක් පාසා මා හට මතක් වෙන්නෙ ඔබතුමියයි.**

**ඔබ තුමිය දන්නා සියලු දේ කියා දුන්නාට ඔබතුමියට ස්තූති කිරිමට මම මෙය අවස්ථාවක් කරගනිමි.**

**ආදරණීය හඳා අතාවුද ගුරුමෑණියනි ඔබතුමියට මේ ග්‍රන්ථය සතුටින් පිරිණමම.**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “**හෙරණගත්කරණී**” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඔන්න එකමත් එක කාලෙක ලස්සන රටක් තිබුණා. ඒ රටේ අහසට උඩින් වෙන ලෝකයක් තිබුණා. ඒ ලෝකේ නම තමයි සුරංගනා ලෝකය.



ඉතින් ඒ ලෝකෙ ඒ කියන්නෙ සුරංගනා ලෝකෙ ඉන්නෙ සුරංගනාවියෝ චූටි බබාලයි ලොකු අයයි නිදි වෙලාවට ඒ කියන්නේ රෑට ඒ ඒ රටවල් වලට යනවා. ඊට පස්සෙ උදේ පාන්දර වෙනකල් ඉඳලා ඉර පායනකොට පිපෙන මල් වල පැණි අරගෙන ආපහු සුරංගනා ලෝකෙට යනවා.



ඔයාලා දන්නවනේ සමනල්ලු. සමනල්ලු එන්නෙත් සුරංගනාවියොත් එක්ක. සමනල්ලු එක්ක ඇවිල්ලා සුරංගනාවියන්ට පැණි අරගෙන දීලා සමනල්ලුත් බඩ පුරවාගෙන ටිකක් ඇවිදලා ආපහු සුරංගනා ලෝකෙට යනවා.



**සුරංගනාවියෝ මල් පැණි එකතු කරන්නෙ ඇයි දන්නව ද? එයාලා සීත කාලෙයට මල් පැණි වලින් ලොකුම ලොකු උත්සවයක් පවත්වනවා. සීත කාලය එන්න තියෙන්නෙ තව දවස් 12යි දැන් සුරංගනා ලෝකයම එකම කලබලයයි.**



ඉතින් ඔන්න හැම ලෝකෙම ඉන්නවා
වගේ මේ ලෝකෙත් හිටියා සුරංගනා
රජෙකුයි රැජිනකුයි. ඒ රජුටයි
රැජිනටයි හිටියා ලස්සන දුවෙක්
එයාගෙ නම තමයි ෆ්ලෝරා නැන්සි
කුමරිය.



මම දැන් මිනිස් ලෝකෙ ගැන
කියන්නම්කෝ. මිනිස් ලෝකයේ ලස්සන
රටක ලස්සන නගරයක ලස්සන
ගෙයක අත්තම්මෙකුයි
අම්මෙකුයි තාත්තෙකුයි අයියෙකුයි
නංගියෙකුයි ජීවත් වුණා. එයාලා ජීවත්
වුණේ හරි සතුටින්.




හැබැයි මෙයාලගේ අම්මයි තාත්තයි හැමදාම ගෙදර හිටියේ නෑ. මොකද මෙයාලගෙ අම්මයි තාත්තයි හැමදාම වැඩට ගියා. ඉරිදා දවසට විතරයි ගෙදර හිටියේ. අත්තම්මයි අයියයි නංගියි නැනී විතරයි. නැනී කියන්නේ එයාලව බලාගන්න කෙනාට.



නැනී එයාලව හොදින් බලාගත්තා. ඒත් එයාලා සතුටින් නෙවෙයි හිටියේ. මොකද එයාලා එක්ක අම්මටයි තාත්තටයි කාලය ගත කරන්න බැරි නිසා. අම්මයි තාත්තයි නිවාඩු දවසෙත් ඒ කියන්නෙ ඉරිදා දවසෙත් එයාලා ගෙදර නැහැ. ඒක නිසයි අයියයි නංගියි ගොඩක් දුක් වුණේ.



ඔන්න එක රෑක අයියයි නංගියි අම්මයි තාත්තයි අත්තම්මයි පවුලේ හැමෝම නිදාගෙනයි හිටයේ. ඔන්න ඒ රෑ සුරංගනා ලෝකයේ කුමරිය ෆ්ලෝරා නැන්සි මල් පැණි එකතු කරගන්න ඒ නගරයට ඇවිල්ලයි හිටයේ. ඒ වෙලාවේ ෆ්ලෝරා නැන්සියි එයාගේ සමනල්ලු ටිකටයි හැංගිලා හිටයේ අර ලස්සන ගෙදර කුස්සියේ.



ඔයාලා දන්නවද ඇයි ඒ වෙලාව අවාසනාවන්ත වුණේ කියලා. හැබැයි ඒවෙලාව අවසනාවන්ත වුනෙත් නෑ. ඒ ගෙදර හිටපු නංගි වතුර ටිකක් බොන්න නින්දෙන් ඇහැරිලා කුස්සියට එන ගමනුයි හිටියේ. ආ මට අමතක වුනානේ අර ගෙදර හිටපු අයියයි නංගිගෙයි නම් කියන්න. අයියගේ නම තමයි ඩේව් ක්‍රිස්ටන්. නංගිගේ නම තමයි ඩස්නි අයෝරා.




ඒ වෙලාවෙදි ෆ්ලෝරා නැන්සි කුමරිය අයෝරා පඩිපෙළ බැහැගෙන එනවා දැක්කේ නැහැ. ෆ්ලෝරා නැන්සි කුමරිය හැංගිලා හිටියේ. වතුර ජෝගුවයි වතුර වීදුරුවයි තිබුණු මේසෙ යට. අයෝරා ෆ්ලෝරා නැන්සි කුමරිය හිටපු තැනටම ආවා. අයෝරා වතුර බොද්දි දැක්ක රිදී පාටින් බැබලෙන ඔටුන්නක්.




අයෝරාගේ කටේ තිබුණු වතුර ටික විසිවෙලා ගියේ එයාට තිබුණු බයට. ඒ වතුර ටික විසි වුනේ කුමරියගේ ඇගට. කුමරිය එකපාරටම නැගිටලා අයෝරා දිහා බැලුවා. අයෝරා හොඳටම බය වුණා. ඒක නිසාම එයා විසිවෙලා ගිහින් සෝපාව උඩට වැටුනා. එයා සෝපාවෙන් නැගිටලා දුවගෙන ගිහින් ලයිට් එක දැම්මා.

ලයිට් එක දැම්මහම එයා ෆ්ලෝරා නැන්සි කුමරියගෙ මුහුණ ඉතාම කරුණාවන්ත ස්වරූපයක් අරගෙන තිබුණ නිසා අයෝරා බය වුණේ නෑ. ටික වෙලාවක් එතන නිශ්ශබ්දව තිබුණා. ඊට පස්සේ අයෝරා කතා කරා. එයා ෆ්ලෝරා නැන්සි කුමරියගෙන් මෙහෙම ඇහුවා. කවුද ඔයා? ඔයා ඇයි අපේ ගෙදරට ආවෙ? ඇයි ඔයා මෙහෙම හැංගිලා ඉන්නේ? ඔන්න ඔය විදියට ලොකු ප්‍රශ්න වැලක් අයෝරා ඇහුවා.




අයෝරා එහෙම ඇහැව්වට පස්සෙ ෆ්ලෝරා නැන්සි කුමරිය මෙහෙම කිව්වා. මම සුරංගනා ලෝකෙ ඉඳලයි ආවෙ. අයෝරා ඔයා මේක පිලිගන්නෙ නැතිවෙයි ඒත් කියන්නෙ ඇත්ත මම සුරංගනා ලෝකෙ ඉඳලයි ආවෙ. අයෝරා ඔයා මේක පිළිගන්නෙ නැතිවෙයි ඒත් මම කියන්නෙ ඇත්ත.




මම සුරංගනා ලෝකෙ රජුගෙයි
රැජිනගෙයි දුව. මගේ නම ෆ්ලෝරා
නැන්සි. මම ආවේ ඉර පායනකොට
පිපෙන මල්වල පැණි අරගෙන යන්න.
මොකද සුරංගනා ලෝකේ සීත
කාලයට තියෙන ලොකුම පැණි
උත්සවයට පැණි අරගෙන යන්න.
ඒකට තියෙන්නෙ තව දවස් 12යි. මෙ
කතාව අහගෙන හිටපු අයෝරා
හොඳටම හිනා වුණා. එයා කව්වා
ඇත්තටම සුරංගනා
ලෝකයක් තියනවා නම් මාව
එක්කගෙන යන්න කියලා.

ෆ්ලෝරා නැන්සි ඒ කතාවට එකග වුණා. ඒත් ෆ්ලෝරා කිව්වා ඔයා එහෙ ගිහින් කරුණාවන්ත කෙනෙක් විදියට හැසිරෙයි කියලා මම හිතනවා. ඉර පායන්න තියෙන්නෙ තව පැය පහයි. අපි ඉක්මනින් සුරංගනා ලෝකයට ගිහින් එමු .එහෙම කිව්වෙ අයෝරා. එයාලා ගොඩක් ඉක්මනින් සුරංගනා ලෝකයට ගියා. ඇත්තටම අයෝරට පුදුමයි සුරංගනා ලෝකය කියලා ඇත්තටම තැනක් තියනවා. අයෝරා ඇති තරම් විනෝද වුණා.



ඒ වෙලාවේ අයෝරයි ෆ්ලෝරයි
හොඳම යාලුවෝ වුණා. අයෝරා
සුරංගනා ලෝකය රහසක්
විදියට තියා ගත්තා. අයෝරා
සුරංගනා ලෝකෙන් එලියට එද්දි
ෆ්ලෝරා එයාට පුංචි තෑග්ගක් දුන්නා.
ඒ තෑග්ගෙ තිබ්බෙ සුරංගනා
ලෝකෙ තිබ්බ මුතු ඇටයක්. අයෝරා
ෆ්ලෝරට ස්තූති කරා. ෆ්ලෝරා සහ
අයෝරා ඉක්මණින් මිනිස්
ලෝකෙට ගියා. එතකොට වෙලාව
උදේ පහ හමාරයි.



# එදා ඉදලා අයෝරා සහ ෆ්ලෝරා සුරංගනා ලෝකයට ගිහින් එනවා. ඊට පස්සෙ එහෙදි විනෝද වෙලා උදේට මිනිස් ලෝකෙට එනවා. අයෝරා පැණි උත්සවයටත් ගියා එහෙදි අයෝරා ෆ්ලෝරා ගොඩක් විනෝද වුණා. එදා ඉදලා  ඒ දෙන්නා හොඳම යාලුවෝ වුණා.



මේ පොත කියවන පුංචි

ඔයත් කැමති ද සුරංගනා ලෝකයට යන්න.

එහෙනම් හොඳ ළමයෙක් විදිහට වැඩ කරන්න වෙයි.

හොඳ ළමයෙක් විදිහට ඉන්නත් වෙයි

මේ පොත ලියන මගෙන් පුංචි ඔයාට පුංචි උපදෙසක්.





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

මිල රුː 250/-